---

කුලියාපිටිය නගර සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කුලියාපිටිය නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). ගබඩා සමීක්ෂණයට අනුව තොගයෙහි වටිනාකම රු.8,078,128 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එම ශේෂය රු.16,200,834 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා ශේෂය රු.8,122,706 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). සභාව විසින් ලබාගෙන ඇති ආසියානු සංවර්ධන බැංකු ණය වෙනුවෙන් එකී අරමුදලට ගෙවිය යුතු පොලිය වූ රු.1,343,503 ක් ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම ණය මුදල වෙනුවෙන් ගෙවිය යුතු රු.2,184,995 ක ණය වාරික, ණය ගිණුමෙන් ඉවත්කර ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන ව්‍යාපෘතීන් යටතේ ඉටුකිරීමට සැළසුම් කර තිබූ එහෙත් ඉටුකර නොතිබූ ප්‍රාග්ධන ව්‍යාපෘතීන් 10 කට අදාලව රු.13,627,856 ක අගයක් ණයහිමි ශේෂය තුල පැවතුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.53,255,509 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,942,442 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,387,723 ක් විය.

2.2 මූල්‍ය පාලනය

2008 වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු.376,721 ක නිරවුල් නොකරන ලද ශේෂ පැවති අතර 2010 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකු ණය පොලී ගෙවීම සඳහා වෙන්කරන ලද රු.3,611,168 ක ප්‍රමාණයක් අදාල පොලී ගෙවීම් කර අවසන්ව තිබියදී ණයහිමි යටතේ දක්වා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 9,398 | 9,280 | 6,443 |
| (ii) | බදුකුලී | 10,193 | 10,640 | 1,254 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 13,559 | 13,559 | - |
| (iv) | වෙනත් ආදායම් | 55,155 | 51,329 | 10,790 |

2.3.2 වරිපනම් බදු

2012 වර්ෂයට අදාල වරිපනම් බිල් කිරීම් රු.7,859,249 ක් වූ අතර වර්ෂය අවසානයට රු.5,493,262 ක වරිපනම් හිඟයක් නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව වරෙන්තු නිකුත්

කර හිඟ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. විගණනයේදී සිදුකල නියැදි පරීක්ෂාවේදී උර්ඝකාලීනව අයනොවී පවතින රු.516,079 ක හිඟ ශේෂ පැවතුණි.

2.3.3 බස්නැවතුම්පල ගාස්තු

සභාව විසින් බස් නැවතුම් පොල ගාස්තු ලෙස ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ රථ ගාලට ඇතුලත් කිරිම සඳහා රු.25,000 ක මාසික ගාස්තුවක් අයකරනු ලැබුවද ඊට අදාල ගිවිසුමක් විගණනයට ඉදිරිපත් නොවුණි. ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් 2012 දෙසැම්බර් 31 දිනට සභාවට රු.298,806 ක් අයවිය යුතුව පැවතියද මෙතෙක් එකී මුදල් අයකර ගැනීමට අදාල පියවර ගෙන නොතිබු අතර, මෙම හිඟ සම්බන්ධයෙන් දඩ මුදල් ගණනය කිරීමක්ද සිදුව නොතිබුණි.

2.3.4 ජල ගාස්තු

ජල ගාස්තු නොගෙවීම මත ජල සම්බන්ධතා විසන්ධිකර තිබූ ජල පාර්භෝගිකයින් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.51,085 ක හිඟ ජල ගාස්තු ශේෂයක් පැවති අතර, නගර සභා ජල යෝජනා ක්‍රමය යටතේ පොලිස් නිවාස 14 කට ජල සම්බන්ධතා ලබාදී තිබූ අතර ඒ සඳහා පැවති ජල මනු අක්‍රියව පැවතීම හේතුවෙන් මාසිකව රු.150 ක ස්ථිර ගාස්තුවක් අයකර තිබුණි. ජලමනු 9 කට අදාලව රු.77,059 ක හිඟ ශේෂයක් පැවතුණි.

2.3.5 විනෝද බදු

සිනමා ශාලා වලින් විනෝද බදු මුදල් අයකිරීමට අදාල ප්‍රවේශ පත්‍ර මුද්‍රා තබන අවස්ථාවේදී අදාල විනෝද බද්ද අයකිරීමක් සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් සනමා ශාලා 3 කට අදාලව 2012 දෙසැම්බර් 31 දින රු.796,488 ක හිඟ විනෝද බදු පැවතුණි.

2.3.6 වාහන නවතා තැබීමේ ගාස්තු

සභා බල ප්‍රදේශය තුල වාහන නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරවාගෙන නොමැති අතර සභා බල ප්‍රදේශයේ පවතින ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචිය හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් සිදුව නොතිබුණි.

2.3.7 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු…5,899,892 ක් විය.

2.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

සභාවට අයත් කුලියාපිටිය - මාදම්පේ මාර්ගයේ පිහිටි පැරණි කච්චේරි ගොඩනැගිල්ල මාසිකව රු.30,000 ක මුදලකට කුලියට දී තිබූ අතර, බදුකරු විසින් මෙකී ගොඩනැගිල්ල රු.2,000,000 පමණ වියදමකින් අළුත්වැඩියා කර ඇති බව දක්වා තිබුණි. එහෙත් ඒ සඳහා ලබාගත් අනුමැතිය

බදුකරු සමඟ ඇතිකරගත් එකඟතාවය, අළුත්වැඩියාවට අදාල සභාව අනුමත කල ඇස්තමේන්තුව ඉදිරිපත් නොවුණි. බදුකරු සමඟ ඇතිකරගෙන තිබූ ගිවිසුමෙහි ඇප මුදල් සම්බන්ධව වගන්තියක් සඳහන්ව නොතිබූ අතර, මෙකී ගොඩනැගිල්ලට අදාලව ඇප තැන්පතු ලෙස රු.90,000 ක් ලබාගෙන තිබුණි.

2.5 <u>අවිධිමත් ගනුදෙනු</u>

පළාත් පාලන ආයතනවල නගරාධිපති, සභාපතිවරු හා නිළධාරීන් වෙනුවෙන් 2012 අගෝස්තු 09 දින සිට 16 දින දක්වා වූ වියට්නාම සංචාරය සඳහා වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජුලි 25 දිනැති අංක GGRC/21/30 දරන ලිපිය අනුව ගුවන් ගමන් ගාස්තු, ආහාර සහ නවාතැන්ද ඇතුළු සියළු වියදම් සඳහා රු.172,500 ක් හා අනියම් දීමනා ලෙස දිනකට ඇ.එ.ජ.ඩොලර් 30 ක් බැගින් සභා අරමුදලින් වියදම් දැරීමට අනුමත කර තිබුණි. ඒ අනුව සංචාරය වෙනුවෙන් සභා අරමුදලින් දැරිය හැකි මුදල රු.401,171 වුවද මෙකී සංචාරය සඳහා සභා අරමුදලින් රු.497,371 ක් දරා තිබුණි.

2.6 <u>වත්කම් කළමනාකරණය</u>

සභාව විසින් ඉඩම් හා ගොඩනැගිලි වලට අදාලව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණ අතර ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක්ද කාලානුරූපීව සිදුකර නොතිබුණි.

2.7 <u>මානව සම්පත් කළමනාකරණය</u>

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 124 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 101 ක් වූයෙන් පුරප්පාඩු 21 ක් පැවති අතර එතුල වූ ලේකම් තනතුර හා කාර්මික නිළධාරී තනතුරු 03 න් 02 ක්ද ආදායම් පරිපාලක තනතුරු 03 න් 01 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩුව පැවතුණි. මීට අමතරව අනියම් ආදේශක පදනමින් සේවකයන් 81 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසාන වන විට සේවයේ යොදවා තිබුණි.

2.8 <u>සභාවට එරෙහි නෛතික කරුණු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). කුලියාපිටිය මාදම්පේ පාර වරිපනම් අංක 206 'බී' දරණ දේපලෙහි අයිතිය සම්බන්ධයෙන් සභාවට එරෙහිව කුලියාපිටිය දිසා අධිකරණයේ අංක 15082 යටතේ පවරන ලද නඩුව විභාග කිරීමෙන් පසු පැමිණිලිකරුට වාසිවන අයුරින් තීන්දුව ලබාදී තිබූ අතර නගර සභාව එම දේපලට කරන ලද අලාභය වෙනුවෙන් රු.500,000 ක මුදලක් ගෙවන ලෙසද නියෝගය කර තිබුණි. සභාව විසින් ඊට එරෙහිව අභියාචනා පෙත්සමක් කුරුණෑගල පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණය වෙත ඉදිරිපත් කර පැවති අතර මෙතෙක් අදාල නඩුව අවසන්ව නොපැවතුණි.

(ආ). ඉඩමක් හරහා කාණුවක් ඉදිකිරීමට එරෙහිව එකී ඉඩම් හිමියන් විසින් 2006.12.08 දින නඩු අංක 15593 L යටතේ සභාව වෙත නඩු පවරා තිබූ අතර, විගණිත දිනය දක්වාම නඩු කටයුතු අවසන්ව නොතිබුණි.

2.9 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…6,771,790 ක් ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසක වාරිකය ලෙස රු…21,451 බැගින් එකී අරමුදල විසන් අයකර පැවතයද, එකී අයකිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ආ). සෞඛ්‍ය ආරක්ෂිත අලෙවි කුටි 50% සහනාධාර යටතේ මත්ස්‍ය නිෂ්පාදන අලෙවිකරුවන්ට හා අලෙවිකරන ආයතන වලට ලබාදීම සඳහා රු.113,160 ක් ගෙවා වයඹ ධීවර කටයුතු අමාත්‍යාංශයෙන් 2012 මැයි මාසයේදී අලෙවිකුටි 6 ක් සභාව ලබාගෙන තිබුණි. මෙකී අලෙවි කුටි සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රතිලාභීන්ට ලබාදී නොතිබූ අතරම මෙම අලෙවි කුටි ප්‍රතිලාභීන්ට නිකුත් කිරීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ඒ සඳහා වැයවූ මුදල් ලබාගැනීම, අලෙවි කුටි තබන ස්ථාන පිළිබඳ ක්‍රමවේදයන් සභාව සකස් කර නොතිබුණි.

(ඇ) සභාව විසින් රු.720,000 ක ප්‍රතිපාදන මත ඉටුකිරීමට සැළසුම් කර තිබූ සුභසාධක කාර්යයන් 9 ක් ද, ඇස්තමේන්තුගත පිරිවැය රු.8,650,000 ක් වූ ප්‍රාග්ධන වැඩසටහන් 13 ක්ද එමෙන්ම ව්‍යාපෘතින් 4 ක් සිදුකිරීම සඳහා 2011 වර්ෂයේදී රු.4,475,107 ක් ණය හිමියන් යටතේ වෙන්කර පැවතියද එකී ව්‍යාපෘති ආරම්භකර හෝ නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය